00012

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපන පීඨය

මුල් ළමාවිය හා ප්‍රාථමික අධ්‍යාපනය ඩිප්ලෝමා වැඩ සටහන -3 වන මට්ටම

අවසාන පරීක්ෂණය - **2020/2021**

**ESD1231/EPD3531** - විෂයමාලා අධ්‍යයනය සහ ප්‍රායෝගික වැඩ (භාෂා අධ්‍යයනය - සිංහල)

කාලය - පැය තුනයි. (03)

දිනය - 2023.07.08 වේලාව - පෙ.ව.09.30 - ප.ව.12.30 දක්වා

1 වන කොටසේ සියළුම ප්‍රශ්නවලට ද, 2 වන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකට ද (03) පිළිතුරු සපයන්න.

## 1 වන කොටස

01. භාෂාව යනු කුමක් ද? අර්ථකථනය කරන්න.

02. භාෂාව පිළිබඳ ව පවතින වැදගත් අදහස් පහක් (05) ලියන්න.

03. දරුවෙකු භාෂාව ග්‍රහණය කර ගන්නා අවධි හතර (04) නම් කරන්න.

04. ප්‍රාථමික පන්තිකාමරයක සිටින සවන්දීමේ දුර්වලතා සහිත ශිෂ්‍යයකු තුළ හඳුනාගත හැකි ලක්ෂණ තුනක් (03) කෙටියෙන් පැහැදිලි කරන්න.

05. නිවේදනයක අන්තර්ගත විය යුතු වැදගත් කරුණු පහක් (05) ලියන්න.

06. නිපුණතා පාදක විෂයමාලාව යන්න කෙටියෙන් පැහැදිලි කරන්න.

07. ප්‍රාථමික අධ්‍යාපන අවධියේ දී ඉගෙනුම් ආධාරක භාවිත කිරීමේ වැදගත්කම් තුනක් (03) පැහැදිලි කරන්න.

08. "නිර්මාණාත්මක චින්තනය" යන්න ඔබේ වචනයෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 05 x 08 = 40)

## 2 වන කොටස

09. i.) 1997 ප්‍රාථමික අධ්‍යාපන ප්‍රතිසංස්කරණ හඳුන්වාදීමට මුල් වූ කරුණු **පහක් (05)** පැහැදිලි කරන්න. (ලකුණු 10)

ii.) පහත සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමු කරමින් ප්‍රාථමික අධ්‍යාපනයේ ප්‍රධාන අවධි පිළිබඳව විවේචනාත්මක විමර්ශනයක් කරන්න.

- ප්‍රධාන අවධි තුනකට බෙදීම
- තක්සේරු කිරීම හා ඇගයීම
- ඉගෙනුම් -ඉගැන්වීම් ක්‍රමවේද
- ප්‍රවේශ නිපුණතා
- පන්තිකාමර පරිසරය

(ලකුණු 10)

10. i.) ප්‍රාථමික අධ්‍යාපනය තුළ ක්‍රියාත්මක වන අත්‍යාවශ්‍ය ඉගෙනුම් නිපුණතා වැඩසටහනෙහි වැදගත්කම කරුණු ඉදිරිපත් කරමින් තහවුරු කරන්න. (ලකුණු 10)

ii.) "ගුරුවරයාගේ වගකීම විය යුත්තේ තම පන්තියෙහි සිසුන් වැඩි පිරිසක් තුළ අභිමත ඉගෙනුම් නිපුණතා වර්ධනය කිරීමයි."
මෙම අදහස උදාහරණ ඉදිරිපත් කරමින් පැහැදිලි කරන්න. (ලකුණු 10)

11. i.) ප්‍රාථමික ශ්‍රේණිවලදී භාෂාව ඉගැන්වීම සඳහා භාවිත කළ හැකි ඉගෙනුම් ආධාරක **පහක් (05)** නම් කර ඒවා කෙටියෙන් පැහැදිලි කරන්න. ( අවශ්‍ය අවස්ථාවලදී රූප සටහන් භාවිත කරන්න.) (ලකුණු 10)

ii.) ඉගෙනුම් ආධාරක භාවිතයේ දී ගුරුවරයා තම අවධානය යොමු කළයුතු කරුණු **පහක් (05)** සාකච්ඡා කරන්න. (ලකුණු 10)

12. i.) "සිසුන් තුළ භාෂා කුසලතා වර්ධනය කිරීම ප්‍රාථමික ශ්‍රේණියේ ගුරුවරයාගේ ප්‍රධානතම වගකීමකි. "

කරුණු ඉදිරිපත් කරමින් මෙම ප්‍රකාශය තහවුරු කරන්න. (ලකුණු 10)

ii.) සිසුන්ගේ වාග්මාලාව දියුණු කිරීම සඳහා පන්තිකාමරය තුළ භාවිත කළ හැකි ක්‍රියාකාරකම් **තුනක් (03)** පැහැදිලි කරන්න. (ලකුණු 10)

13. i.) ප්‍රාථමික පාසල් සිසුන් තුළ දැකිය හැකි ලිවීම සම්බන්ධ ගැටලු **පහක් (05)** කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 10)

ii) ඉහත සඳහන් කළ එක් ගැටලුවක් විසඳීම සඳහා ගුරුවරයෙකු වශයෙන් ඔබ මැදිහත් වන ආකාරය පියවරෙන් පියවර පැහැදිලි කරන්න. (ලකුණු 10)

හිමිකම් ඇවිරිණි.